# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2019 අංක 23 දරන ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2019 නොවැම්බර් මස 18 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2019 නොවැම්බර් මස 22 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකි ය.

**මිල :** රු. 16.00 තැපැල් ගාස්තුව **:** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2019 අංක 23 දරන ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2019 නොවැම්බර් මස 18 වන දින]

එල්.ඩී.—ඕ. (අයි.එන්.සී.) 01/2015

### ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

''ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය'' යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන මණ්ඩලයක්, එකී මණ්ඩලයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව, එළදයී ලෙස එකී මණ්ඩලයේ පරමාර්ථ කරගෙන යාමේ හා ඊට අදාළ සියලු කාරණා ඉටු කිරීමේ කාර්යය සඳහා 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද:

එකී මණ්ඩලය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, එම පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී මණ්ඩලය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් ද, සහ එකී ආයතනය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, එකී ඉල්ලීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2019 අංක 23 දරන ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දින සිට සහ ඉන් පසුව (මෙහි මින්මතු ''මණ්ඩලය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් මින්මතු ඇතුළත් කර ගනු ලබන සියලු තැනැත්තන් (මෙහි මින්මතු ''සංස්ථාපිත මණ්ඩලය'' වශයෙන් සඳහන් කරනු ලබන) ''ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය'' යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාපිත මණ්ඩලය විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු

පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ.

3. සංස්ථාපිත මණ්ඩලය සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:-

(අ) ඉදිකිරීම් කටයුතුවල නිරතව සිටින්නන්ගේ අභිලාෂයන් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා නියෝජිත ආයතනයක් ලෙස ක්‍රියා කිරීම;

(ආ) ජාතික ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය දිරිගැන්වීම සඳහා අදාළ අධිකාරීන්ට සහාය වීම;

(ඇ) ජාතික වැදගත්කමක් ඇති කරුණු අධ්‍යයනය කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඈ) සිය සාමාජිකයන්ට අදාළ ව්‍යාපෘතිවල එකී ක්ෂේත්‍ර සඳහා වෘත්තිකයන්ගේ මූල මණ්ඩල පිහිටුවීම සහ එම ව්‍යාපෘති පිළිබඳ ඇගයීම් කිරීම සහ වාර්තා හා සහතික නිකුත් කිරීම;

(ඉ) ජාතික ඉදිකිරීම් කර්මාන්තය තුළ සාමාජිකයන්ගේ වෙළෙඳ ව්‍යාපාර සඳහා එම වෙළෙඳ ව්‍යාපාරවල ඉල්ලීම මත කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ මධ්‍යස්ථානයක් වශයෙන් කටයුතු කිරීම;

(ඊ) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය ලැබීම මත සහ 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ විධිවිධානවලට සහ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ප්‍රමිතීන්ට සහ මාර්ගෝපදේශයන්ට යටත්ව සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් සඳහා ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත කොන්ත්‍රාත් ලබා ගැනීම;

(උ) දේශීය ඉදිකිරීම් කර්මාන්තය වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා ශිෂ්‍යත්ව සහ අධිශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම;

(ඌ) 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 2 වන වගන්තිය යටතේ ස්ථාපනය කරන ලද තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමතය මත පුහුණු පාඨමාලා පැවැත්වීම සහ සහතිකපත් නිකුත් කිරීම; සහ

(එ) ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සඳහා දයක වනු ලබන හෝ පරිත්‍යාග කරනු ලබන අරමුදල්වලට භාරකරුවන්, රැකවරණ සලසන්නන් හෝ කළමනාකරුවන් වශයෙන් කටයුතු කිරීම.

ආණ්ඩුවේ හෝ පළාත් සභාවක අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කාර්ය සමඟ ගැටුම් ඇති නොවන බවට සංස්ථාපිත මණ්ඩලය සහතික විය යුතු බව.

**4.** ආණ්ඩුවේ හෝ යම් පළාත් සභාවක යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් සමගාමීව පවත්වාගෙන යනු ලබන යම් කාර්යයක් සහ සංස්ථාවේ කාර්යය අතර, කිසිදු ගැටුමක් නිර්මාණය නොවන ආකාරයෙන් සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කළ යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම, මේ පනතේ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මඟින් නිශ්චිතව දක්වනු ලබන ධුර දරන්නන්ගෙන් සමන්විත වන කළමනාකරණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබිය යුතු ය.

(2) (අ) මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරනු ලැබූ මණ්ඩලයෙහි කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මඟින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ප්‍රථම කළමනාකරණ මණ්ඩලය පත් කරනු ලබන තෙක් හෝ තෝරා පත් කර ගනු ලබන තෙක් සංස්ථාපිත මණ්ඩලයේ අතුරු කමිටුව ලෙස කටයුතු කළ යුතු ය.

(ආ) අතුරු කමිටුවට, සංස්ථාපිත මණ්ඩලයේ අන්තර්කාලීන පරිපාලනය සඳහා සහ පළමු කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් තෝරා ගැනීම හෝ පත් කිරීම සඳහා රීති සෑදීමට බලය තිබිය යුතු ය.

(ඇ) අතුරු කමිටුවේ යම් තීරණයක් යම් රැස්වීමකට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර කැමැත්ත මත ගනු ලැබිය යුතු ය.

(ඈ) මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයේ සිට වසරක් ඇතුළත සංස්ථාපිත මණ්ඩලයේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය පත් කිරීම හෝ තෝරා පත් කිරීම කරනු ලැබිය යුතු ය.

(3) (අ) අනුශාසකවරුන් සහ උපදේශකවරුන් ද ඇතුළුව කළමනාකරණ මණ්ඩලයේ සෑම ධුර දරන්නකු ම වර්ෂ තුනක කාලයක් සඳහා පත් කර ගැනීම හෝ තෝරා පත් කර ගැනීම කළ යුතු අතර, එම වර්ෂ තුනක කාලසීමාව ඉකුත් වීමෙන් පසුව ඒ ධුර දරන්නා, අනුශාසකවරයා හෝ උපදේශකවරයා නැවත පත් කර ගැනීමට හෝ තෝරා පත් කර ගැනීමට සුදුස්සකු විය යුතු ය.

(ආ) යම් ධුර දරන්නකු මිය යෑම, ඉල්ලා අස්වීම, අශක්නුතාවකට පත්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක දී, කළමනාකරණ මණ්ඩලය විසින් සංස්ථාපිත මණ්ඩලයේ රීති සැලකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා ගැනීම හෝ තෝරා පත් කර ගැනීම කළ යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ තෝරාගත් හෝ තෝරා පත්කර ගනු ලැබූ තැනැත්තා ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා පමණක් ධුරය දැරිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ බලතල.

**6.** මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා-

(අ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලදී ගැනීම, අත්පත් කර ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම, අලුත්වැඩියා කිරීම සහ අන්‍යාකාරයකින් ලබා ගැනීම සහ සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව සුදුසු යැයි සලකනු ලැබිය හැකි අයුරින් ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ඒවා බැහැර කිරීම;

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා හෝ එහි බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පරිදි සෘජුව හෝ සංස්ථාපිත මණ්ඩලය විසින් ඒ සම්බන්ධයෙන් බලය පවරන ලද නිලධරයකු හෝ අනුයෝජිතයකු මාර්ගයෙන් සියලු යම් කොන්ත්‍රාත්තු හෝ ගිවිසුම්වලට ඇතුළත් වීම, ක්‍රියාත්මක කිරීම හෝ කරගෙන යාම;

(ඇ) ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම සහ රැස් කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුව ද, සංස්ථාපිත මණ්ඩලය වෙත ලබා දෙන සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් සංස්ථාපිත මණ්ඩලය විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබාගත යුතු ය;

(ඈ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සකස් කිරීම, ලිවීම, භාර ගැනීම, වට්ටම් කිරීම, පිටසන් කිරීම, ගනුදෙනු කිරීම, මිලට ගැනීම, විකිණීම සහ නිකුත් කිරීම සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා වහා අවශ්‍ය නොවන යම් අරමුදල්, කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයකින් ආයෝජනය කිරීම;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව යම් නීත්‍යනුකූල භාරයක් හෝ නිශ්චල හෝ පෞද්ගලික දේපළක් භාර ගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ පරිපාලනය කිරීම;

(උ) සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම, සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය පවත්වාගෙන යාම සහ සංස්ථාපිත මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීම;

(ඌ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව දේශන, සම්මන්ත්‍රණ සහ සමුළු සංවිධානය කිරීම;

(එ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති අනෙකුත් දේශීය හා විදේශීය ආයතන සමග සම්බන්ධතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම;

(ඒ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත සේවා පිරිස් පුහුණු කිරීම;

(ඔ) සංස්ථාපිත මණ්ඩලයේ ක්‍රියාකාරීත්වයන් හෝ ඉදිකිරීම් කර්මාන්තයට අදාළ කාරණා සම්බන්ධ පුවත්පත්, වෙළෙඳ නාමාවලියන්, ජර්නල්, සඟරා හෝ වාර සඟරා ස්ථාපිත කිරීම, මුද්‍රණය කිරීම, සහ ප්‍රකාශයට පත්කිරීම සහ කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් ආකාරයකට එකී තොරතුරු බෙද හැරීම; සහ

(ඕ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ නිසි ලෙස සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ සුදුසු වෙනත් සියලු දේ කිරීම,

සඳහා බලය ඇතුළුව අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා හා කාරණා කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාපිත මණ්ඩලයට තිබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ රීති.

**7.** (1) සංස්ථාපිත මණ්ඩලය විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යනුකූල විය යුතු ය:-

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, සාමාජිකයන් ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු;

(ආ) කළමනාකරණ මණ්ඩලයේ ධුර දරන්නන් තෝරා පත් කර ගැනීම, ධුර දරන්නන් ධුරය අත් හැරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීමේ නියම හා කොන්දේසි, ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඈ) කළමනාකරණ මණ්ඩලයේ හෝ එහි යම් අනුකමිටුවක රැස්වීම් කැඳවීමේ දී, පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් පිළිබඳ දැන්වීම හා න්‍යාය පත්‍ර, ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ සහ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකු වීමට අවශ්‍ය සුදුසුකම් හා නුසුදුසුකම්;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම; සහ

(උ) පොදුවේ සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ ඉටු කර ගැනීම සහ සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීම.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදන ලද යම් රීතියක්, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන්, එවැනි ම රැස්වීමක දී එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) (1) වන වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාපිත මණ්ඩලයේ රීති *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

(4) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් සෑම කල්හි ම සංස්ථාපිත මණ්ඩලයේ බලපවත්වන රීතිවලට යටත් විය යුතු ය.

සාමාජිකයන්ගේ සාමාජික ලේඛනය.

8. කළමනාකරණ මණ්ඩලය විසින් සාමාජිකයන්ගේ සාමාජික ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර, එහි සාමාජිකයන්ගේ නම, ලිපිනය සහ අනෙකුත් අත්‍යවශ්‍ය විස්තර අන්තර්ගත කරනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල.

**9.** (1) සංස්ථාපිත මණ්ඩලයට එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය සඳහා සහ ඒ වෙනුවෙන් ත්‍යාග, රික්තවාරණ, පරිත්‍යාග, සාමාජික මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබුණු සියලු මුදල්, කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාපිත මණ්ඩලයේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හා ඉටු කිරීමේ දී සංස්ථාපිත මණ්ඩලය විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**10.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් එහි ආදායම හා වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාපිත මණ්ඩලයේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව, නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන් ම ගණකාධිකාරීවරයකු

වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

11. (1) කළමනාකරණ මණ්ඩලය විසින් සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂයක් සඳහා ම සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සමඟ, වාර්තාව අදාළ වන වසරට පසුව එළඹෙන වර්ෂයේ සය මාසයක් ඉකුත් වීමට පෙර ඉදිකිරීම් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත සහ 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. වාර්ෂික වාර්තාව.

(2) (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාවට, මුදල් වර්ෂය තුළ දී සංස්ථාපිත මණ්ඩලය වෙත විදේශීය සහ දේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙනම ගිණුම් වාර්තාවක් අමුණා තිබිය යුතු ය.

12. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පොරාතු ව ම වූ දිනයේ දී මණ්ඩලය විසින් ගෙවිය යුතුව තිබූ සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවිය යුතු අතර, එදිනට මණ්ඩලයට අය විය යුතු ව තිබූ සියලු ණය සහ මණ්ඩලයට ගෙවිය යුතු සියලු දයක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලය වෙත ගෙවනු ලැබිය යුතු ය. මණ්ඩලය විසින් ගෙවිය යුතු සහ මණ්ඩලයට අයවිය යුතු ණය.

13. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී මණ්ඩලය සතුව පැවති සියලු චංචල සහ නිශ්චල දේපළ, සියලු කාර්ය සඳහා එකී දේපළවලට බලපානු ලබන යම් භාරයක්, කොන්දේසියක් හෝ වෙන යම් ලිඛිත නීතියක විධිවිධානයකට යටත් ව මෙයින් සංස්ථාපිත මණ්ඩලය සතු විය යුතු ය. මණ්ඩලය සතු දේපළ.

14. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් හෝ අන්‍යාකාරයකින් සංස්ථාපිත මණ්ඩලය සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව නීතියෙන් සංස්ථාපිත මණ්ඩලයට සංස්ථාපිත මණ්ඩල විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

හැකියාව සහ බලය ඇති අතර, ඒ සියලු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත් ව, මේ පනතේ කාර්යය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

මුදල් සහ දේපළ අදාළ කර ගැනීම.

**15.** කවර ආකාරයකින් හෝ ලබා ගන්නා ලද සංස්ථාපිත මණ්ඩලයේ මුදල් හා දේපළ, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටු කර ගැනීම උදෙසා පමණක් අදාළ කරගත යුතු අතර, එයින් කවර හෝ කොටසක් සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ට ලාභාංශ, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් සෘජුව හෝ අන්‍යාකාරයෙන් නොගෙවිය යුතු හෝ නොපැවරිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව.

**16.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව, කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිර ව විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව, කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කළමනාකරණ මණ්ඩලයේ ධුර දරන්නකු භාරයේ තිබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ.

**17.** (1) සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුණහොත්, ඒ දේපළ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා, උචිත ආයතනය සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමට පෙරාතුව ම, සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් විසින්, එහි මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන්, තීරණය කරනු ලැබිය යුතු ය.

**18.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**19.** මේ පනතෙහි සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු යි.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.